**මිහින්තලය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මිහින්තලය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු බිල්කිරීම් රු.1,191,830 ක් වුවද ආදායම් වියදම් ගිණුම අනුව රු.1,672,650 ක් වූයෙන් රු.480,820 ක වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (ii) | කඩකුළී බිල්කල ආදායම රු.2,644,800 ක් වුවද ආදායම් වියදම් ගිණුම අනුව රු.1,964,745 ක් වූයෙන් රු.680,055 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (iii) | වරෙන්තු හා දඩ රු. 360,321 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| ( iv) | 2015 වර්ෂය සඳහා ලැබී තිබුණු රු.1,677,600 ක මුද්දර බදු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

| | | | |
|---|---|---|---|
| (v) | පොදු ජංගම ගිණුමෙන් දේශීය ණය ජංගම ගිණුමට රු.601,767 ක මුදල් මාරු කිරීම් ප්‍රාග්ධන වත්කම් විකුණුම් ලැබීම් සහ ණය ආපසු ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජංගම ගිණුම් අතර මාරුකිරීම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (vi). | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාලව වර්ෂයේ ගිණුම් වලට ගෙන තිබුණු ආරම්භක ශේෂ හා 2017 වර්ෂයේ සහතික කරන ලද අවසන් ගිණුමේ අවසාන ශේෂ අතර ගිණුම් විෂයයන් 18 කට අදාලව රු.40,086,976 ක එකතු වෙනසක් විය. | සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අවසාන ශේෂ ඊලඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂයන් ලෙස ගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | ගිණුම් ශේෂ 05 කට අදාලව ගිණුම් හා අදාල ලේඛන අතර රු.2,397,627 ක වෙනසක් විය | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයේ ගිණුම් 22 ක ශේෂ සහ එදිනට ශේෂ පිරික්සුමේ එම ගිණුම් වලට අදාලව දක්වන වටිනාකම් අතර රු.38,225,360 ක වෙනසක් විය. | ප්‍රධාන ලෙජරයේ ගිණුම් ශේෂ ශේෂ පිරික්සුමේ දැක්විය යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 07 කට අදාලව ශේෂ පිරික්සුම අනුව හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර රු.14,181,717 ක එකතු වෙනසක් විය. | ශේෂ පිරික්සුමේ දැක්වෙන වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (v) | 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ හර එකතුව රු. 411,284,411 ක් හා බැර එකතුව රු.414,341,336 ක් වුයෙන් රු.3,056,925 ක වෙනසක් විය. | ශේෂ පිරික්සුමේ හර හා බැර එකතුව සමාන විය යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (vi) | 2018 ජනවාරි 01 දිනට රු.12,730,178 ක් වු සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂයට | නිවැරදිව ගැලපුම් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

රු.3,056,924 ක වර්ෂයේ ඌණතාවය ගැලපුම් කළ පසු ගිණුමේ ශේෂය රු.9,673,254 ක් විය යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.7,288,898 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු. 2,384,356 ක වෙනසක් විය.

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ලැබිය යුතු ගිණුම් ශේෂ 05 කට අදාලව රු.1,002,239 ක් වසර 05 ක් ඉක්මවූ කාලයක සිට අයනොවී පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) වසර 05 සිට 07 දක්වා කාල පරිච්ඡේදයක සිට ගිණුම් වල පැවත එමින් තිබුණු රු.1,209,806 ක් වූ ගිණුම් ශේෂ 09 නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.147,092,218 ක්වූ ගිණුම් විෂයයන් 17 කට අදාලව වත්කම් ලේඛන, හිමිකම් සහතික, විස්තරාත්මක උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සනාථ කිරිමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම පරික්ෂාකර නොතිබුණි. | රීති අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරණ චක්‍රලේඛය | සභාව සතු වාහන 12 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍ර ලේඛය අනුව කළයුතු වේ | ඉදිරිපත් කර නැත |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබද ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍ර ලේඛය අනුව කළයුතු වේ | ඉදිරිපත් කර නැත |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,560,205 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.6,618,435 ක් විය.

| | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 968,750 | 1,191,830 | 983,210 | 480,820 | 1,090,750 | 1,418,180 | 1,145,980 | 272,200 |
| (ii) | කුලී | 10,351,048 | 11,157,048 | 10,866,816 | 912,877 | 9,055,993 | 11,996,542 | 11,373,697 | 622,645 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,783,552 | 17,506,500 | 17,506,500 | - | 2,620,232 | 2,924,451 | 2,924,451 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,789,800 | 1,325,166 | 5,595,844 | 5,010,697 | 1,489,750 | 1,485,822 | 2,052,487 | 8,981,378 |
| | | 16,893,150 | 31,180,544 | 34,952,370 | 6,404,394 | 14,256,725 | 17,824,995 | 17,496,615 | 9,876,223 |

2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ සංවර්ධිත ප්‍රදේශ ප්‍රකාශයට පත්කර , දේපළ වාර්ෂික තක්සේරුවක් සිදුකර වරිපනම් බදු පනවා නොතිබුණි. | වරිපනම් බදු පැනවීම කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කඩකාමර 41 ක 2009 වර්ෂයේ තක්සේරුව පදනම්ව සමාලෝචිත වර්ෂයට කුලී අයකර තිබුණි. | වසර 05 කට වරක් තක්සේරු කර කුලී අයකර ගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය පරිපාලන) රීති 59-66 දක්වා රීති ප්‍රකාරව වෙළඳ බලපත්‍ර, කර්මාන්ත බදු, වෘත්තිය බදු අයකල යුතු ආයතන සම්බන්ධ සමීක්ෂණය පවත්වා ආදායම් හදුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | රීති, අනුව ආදායම් අයකර ගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වරෙන්තු දඩ හා මුද්දර ගාස්තු සම්බන්ධව විධිමත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු අතර පූර්ව වර්ෂ 02 කට අදාලව ලැබිය යුතු වරෙන්තු දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනා ගෙන අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබද කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඇ). අත්හැර දැමූ කර්තව්‍යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන 2018 යටතේ රු.995,000 වටිනා මරදන්කල්ල තොටියාගේ කටුපොත හතරමං හන්දියේ සිට කටුපොත පන්සල දක්වා මාර්ගය මීටර 100 කුට්ටිගල් ඇතිරීම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කරවා ගැනිමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | පුස්තකාලය හා ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.11,996,091 ලබාගෙන තිබූ අතර අදාල වාරික මේ වන විට ගෙවමින් පැවතියද අදාල ශ්‍රවණාගාරය ඉදිකර නොතිබුණි. | ණය මුදල් අදාල කාර්යයන් සඳහා පමණක් යෙදවිය යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රැස්කරන කැලිකසල වර්ග කිරීමකින් තොරව ගල්මඩුව පොතාන ඉහළ මඩුව ප්‍රදේශයේ පිහිටි ඉඩමක ගොඩගසා වලලා දැමීම නිසා පරිසරයට සහ වනසතුන්ට අහිතකර බලපෑම් සිදුවෙමින් තිබුණි. | ඝන අපද්‍රව්‍ය සහ කසල කළමනාකරණය පරිසරයට හිතකර වන අයුරින් සිදුකළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සහ අරමුණු හඳුනාගෙන එම අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 05 ක් ඉක්මවූ කාලයක සිට අය නොවී පවතින රු.59,918 ක ණය ශේෂය සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වාහන 05 ක් ලියාපදිංචි කර නොතිබුණු අතර වාහන 10 ක අයිතිය සභාව වෙත ලබාගෙන නොතිබුණි. තවද භාවිත තත්ත්වයේ පවතින වාහන 10 ක් සඳහා රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි. | වාහන ලියාපදිංචි කර රක්ෂණ ආවරණය ලබාගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු රු.1,340,000 වටිනා වත්කම් ඒකක 03 ක් වසර 5 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.4 ප්‍රසම්පාදනය
---------------
ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------
විගණන හා කළමණාකරන කමිටු
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවරි 28 දිනැති අංක DMA/ 2009 (1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනකරණ කමිටු පැවැති යුතු වේ. | ඉදිරිපත් කර නැත |